<u>උපදෙස් පත්‍රිකාව</u>

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**<u>ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය ( බාහිර- නව නිර්දේශය)100 මට්ටම 2020</u>**

**(අ) විභාග අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්**

I. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියෙන් (2020-06-25 වන දින සිට) බාගත කරන ලද (downloaded) අයදුම්පත් පමණක් අදාළ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

**කලින් වර්ෂවල නිකුත් කරන ලද හෝ තමන් විසින් පිළියෙල කරන ලද හෝ අයදුම්පත් භාරගනු නොලැබේ.**

II. <u>අයදුම්කරන විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද්දා වූ හෝ නියමිත ආකෘති පත්‍රය මගින් නොඑවන ලද්දා වූ හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබුනා වූ හෝ සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.</u>

**(ආ) විභාග අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස්**

*කරුණාකාර මෙම පරිගණක අයදුම්පත්‍රය ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පුරවන්න.*
(***මෙහි අංක යොදා ඇත්තේ විභාග අයදුම්පතෙහි අදාළ අංක අනුව බව සලකන්න.***)

1. ඔබ වෙත නිකුත් කර ඇති බාහිර අපේක්ෂක සටහන් පොතෙහි/ශිෂ්‍යය හැඳුනුම්පතෙහි දැක්වෙන ලියාපදිංචි අංකය අදාල සංකේත අකුරුද සහිතව සම්පූර්ණයෙන්ම ලියන්න. **(උදා: *AE/BA/2018/-------*) / ( *AE/BA/2016/-------*)**

2. ඔබගේ නිවැරදි ***ජාතික හැඳුනුම්පත් අංකය*** මෙහි සඳහන් කරන්න.

3. අදාල කොටුව තුළ "✓" ලකුණ යොදා පූජ්‍ය,මිය,මයා (**Rev., Ms., Mr.)** යන වග සඳහන් කරන්න

4. මුලකුරු සහිත නම මෙහි සඳහන් කරන්න.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| R | . | M | . | N | . | J | A | Y | A | S | U | N | D | A | R | A |

5. මුලකුරු වලින් හැඳින්වෙන නම් සමඟ සම්පූර්ණ නම නිවැරදිව පිළිවෙලට වචන බෙදා ලියන්න.

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| R | A | T | H | N | A | Y | A | K | A | | M | U | D | I | Y | A | N | S | E | L | A | G | E |
| N | I | M | A | L | | J | A | Y | A | S | U | N | D | A | R | A | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

6 1 මෙම විෂයයන් ගෙන් තමන් පෙනී සිටින විෂයයන් ඉදිරියෙන් පමණක් "✓" ලකුණ යොදන්න.

11. භාෂා *විෂයයක්* හැර උපාධි පරීක්ෂණවලට අදාළ ප්‍රශ්න පත්‍ර උපාධි අපේක්ෂකයා විසින් ලියාපදිංචි වී ඇති මාධ්‍යයෙන් ලබා දේ. එම ලියාපදිංචි වී ඇති භාෂා මාධ්‍ය පැහැදිළිව අදාළ ස්ථානයේ සඳහන් කරන්න. **(Sinhala: <u>S</u>, Tamil: <u>T</u>, English : <u>E</u>)**

7 **a** ඔබගේ දුරකථන අංක (නිවස සහ ජංගම දුරකථන අංකය) මෙහි සඳහන් කරන්න.

**b.** ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail ) මෙහි සඳහන් කිරීම අනිවාර්යය වේ. (ඔබට මේ වන විටත් විද්‍යුත් තැපැල් ලිපිනයක් (E-mail ) නොමැති නම් නව විද්‍යුත් තැපැල් ලිපිනයක් (E-mail ) සකස් කර හෝ අදාළ කොටුවේ සඳහන් කරන්න)

8. ඔබගේ ස්ථිර ලිපිනය මෙහි සඳහන් කරන්න.

9. පරීක්ෂණය පහත සඳහන් නගර කේන්ද්‍රීය කොට ගෙන පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ. ඔබට වඩාත් පහසු නගරය **අංක 1 යටතේත්, දෙවැනි තේරීම අංක 2 යටතේත් සහ 3 වන තේරීම අංක 3** යටතේත් සඳහන් කරන්න. **පරීක්ෂණයට අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව මධ්‍යස්ථානය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.**

අපේක්ෂක සංඛ්‍යාව හා නොවැළැක්විය හැකි හේතූන් මත යම් විභාග මධ්‍යස්ථානයක විභාග පැවැත්වීම අවලංගු කිරීමට ඉඩ ඇත. එවැනි අවස්ථාවකදී දෙවැනි තේරීම යටතේ වූ විභාග මධ්‍යස්ථානයට අපේක්ෂකයින් අනුයුක්ත කරනු ලැබේ.

<u>විභාග පවත්වන නගර</u>:
මඩකලපුව, කොළඹ, යාපනය සහ පේරාදෙණිය

10. **විභාග ගාස්තු** (ගාස්තු ගෙවා අදාළ විස්තර සඳහන් කරන්න)

විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවන්ට අනුකූලව වූ නියමිත ගාස්තු මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් **“පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අංක 057-1-001-4-1338036** දරන **ගිණුමට** බැර කරන්න.

මුදල් බැර කිරීමේදී එම මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියේ (Cash Deposit Slip) ***අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ නම*** සඳහන් විය යුතුය. ගිණුමට මුදල් බැර කිරීමෙන් අනතුරුව ඔබ වෙත දෙනු ලබන කුවිතාන්සියේ මුල් පිටපත විභාග අයදුම්පත්‍රයෙහි අදාළ ස්ථානයේ ඇලවිය යුතුය.( එහි ඡායා පිටපතක් තමා වෙත රඳවා ගැනීමට වගබලාගත යුතුය.)

I. එම ගෙවීමට අදාළ දිනය සඳහන් කරන්න.
II. ගෙවීම් කරන ලද මහජන බැංකු ශාඛාව සඳහන් කරන්න.

✸ **මුදල් ඇණවුම්/තැපැල් ඇණවුම්/චෙක්පත් මගින් කෙරෙන ගෙවීම් බාර ගනු නොලැබේ.**

| **විභාගය සඳහා ගාස්තු සටහන** | |
|---|---|
| 1. විභාග අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේ සහ සැකසීමේ ගාස්තුව | රු.1,500/- |
| 2. එක් විෂයයක් සඳහා ගෙවිය යුතු විභාග ගාස්තුව | රු.1,250/- |
| 3. ගෙවිය යුතු මුළු විභාග ගාස්තුව | රු.1,250/- x අයදුම් කරන ලද විෂයයන් ගණන +රු.1,500/- |
| **උදා**:- අයදුම් කරන ලද විෂයයන් ගණන 05ක් යැයි සැලකුවහොත් ගෙවිය යුතු මුළු විභාග ගාස්තුව වනුයේ | රු.1,250/- x 05 + රු.1,500/- =**රු. 7,750/-** |

(ඇ) **වෙනත් උපදෙස්**

**1** වෙබ් අඩවියෙන් බාගත් විභාග අයදුම්පත, ***9’’ x 4’’*** ප්‍රමාණයේ ලිපි කවරයක බහා ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉදිරිපත් වන විභාගයේ නම සහ බාහිර අපේක්ෂකයෙකු වශයෙන් වූ ලියාපදිංචි කිරීමේ අංකය පැහැදිලිව සඳහන් කරන්න.

2 සම්පූර්ණ කරන ලද විභාග අයදුම්පත **ලියාපදිංචි තැපෑලෙන්** පහත ලිපිනයට එවිය යුතු ය.

“නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය, තැ.පෙ. 43, පේරාදෙණිය.”

3 ඉහත දැක්වෙන උපදෙස් වලට අනුකූල නොවන හෝ නියමිත අවශ්‍යතා සම්පූර්ණ නොකරන ලද හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

4 සම්පූර්ණ කරන ලද අයදුම්පතට ඔබේ නම හා ලිපිනය පැහැදිලිව ලියූ රු.50ක් වටිනා මුද්දරයක් අලවන ලද 9’’ x 4’’ ප්‍රමාණයේ ලිපිකවරයක් අමුණා තිබිය යුතුය.

5 සියය මට්ටමේ විෂයන්ට පෙර වර්ෂවලදී පෙනී සිට අසමත්වූ සිසුන්ද මෙම අයදුම්පත මගින් අයදුම්කලයුතුය.

**විශේෂ අවධානයට-:**

- අයදුම්පත යොමු කිරීමට පෙර නියමිත පරිදි අයදුම්පතෙහි **අත්සන** තබා ඇත්දැයි පරීක්ෂා කර බලන්න.
- ***විභාග අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව නම, විෂයයන් වෙනස් කිරීම සහ විභාග මධ්‍යස්ථාන වෙනස් කිරීම සඳහා වූ ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලැබේ.***

**අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය *2020-07-30* වේ.**

අත්සන් කලේ :-

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
ලේඛකාධිකාරී වෙනුවට.
2020-06-25

**සියලුම තොරතුරු සඳහා www.pdn.ac.lk/cdce වෙබ් අඩවියට පිවිසෙන්න.**

**මෙහි දක්වා ඇති නීති රීති කාලානුරූපිව වෙනස් විය හැක.**

➢ මෙම විභාගය සඳහා අයදුම් නොකර අධ්‍යයනාරම්භය කල් දමා නොගන්නා සිසුන්ගේ ශිෂ්‍යභාවය අහෝසි වන අතර අධ්‍යයනාරම්භය කල් දමාගැනීම සඳහා ලිඛිතව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය දැනුවත් කලයුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.